පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය : **290**

ආයතනය : නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

<u>පළමු කොටස:</u>

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	නිවැරදි කරගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර හා වර්ථමාන තත්ත්වය
01.	විගණකාධිපති වරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් ඇතුලත පිළිතුරු සපයා නොතිබීම.	2022.07.22 දිනැති අංක 2289/43 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇත. එම අහෝසි වන අවස්ථාව දක්වා නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද සියලුම විගණන විමසුම් සඳහා මේ වන විට පිළිතුරු සපයා අවසන් කර ඇත.
02.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුලත පිළිතුරු සපයා නොතිබුණි.	2022.07.22 දිනැති අංක 2289/43 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇත. එම අහෝසි වන අවස්ථාව දක්වා එම අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලද සියලුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මේ වන විට පිළිතුරු සපයා ඇත.
03.	මු.රෙ. 134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තා වල සියලු පිටපත් නිවැරදි ලෙස විගණකාධිපති වාර්තා වෙත ඉදිරිපත් කර ඇත. 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා පහත දිනයන්හිදී විගණකාධිපති වෙත යවා ඇත.

අනු අංකය	වාර්තාවේ විෂය	විගණකාධිපති වෙත යවා ඇති දිනය
01	Ben & Nancy මහල් නිවාසයේ 10/6 හා 10/7 යන නිවාස දෙකෙහි ඉදිකිරීම් වල පවතින දෝෂ පිළිබඳ නිවෙස් හිමියා විසින් කළ පැමිණිල්ල සම්බන්ධව	2021.01.22
02	සභාධිපත්‍යය කළමනාකරණ අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නියාමන) වැ.බ.ජේ.එස්.සී.දිසානායක මහතා විසින් කරන ලද මු.රෙ.104 යටතේ ආයතනයට සිදු කර ඇති අලාභය	2021..02.16
03	නාගරික සංවර්ධන අධිකාරියේ වාහන පරිපාලනය,නඩත්තුව හා අළුත්වැඩියාවෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ පරීක්ෂාව	2021.03.05
04	අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යනු ලබන පොදු තැන්පත් ගිණුම සම්බන්ධව	2021.05.17
05	අමාත්‍යාංශයේ බැංකු ගිණුම් හා වාර්ෂික වාර්තා පිළිබඳ වාර්තාව	2021.05.04
06	2021 වර්ෂයේ පළමු කාර්තුව සඳහා පලාත් නවයෙහි නගර සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය	2021.05.11

		07	2021 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘති වල වර්තමාන ප්‍රගතිය	2021.06.08
		08	අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ වටුවර්ගොනු පරීක්ෂාව	2021.08.02
		09	නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින්ගේ අක්‍රමිකතා	2021.08.13
		10	නාගරික සංවර්ධන අධිකාරියේ බැංකු සැසඳුම් වාර්තා පිළිබඳ විගණන විසඳුම	2021.08.13
		11	සභාධිපත්‍යය කළමණාකරණ අධිකාරියේ 2021 ජූනි සහ ජූලි මාසයන්හි බැංකු සැසඳුම් හා චෙක්කම් කළමණාකරණය	2021.09.10
		12	නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2021 බැංකු සැසඳුම් පරීක්ෂාව සහ වාර්ෂික ගබඩා සමීක්ෂණ වාර්තාව	2021.09.13
		13	2020 වර්ෂයේ අයවැය යෝජනා මගින් වෙන්වූ නගර සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ප්‍රසම්පාදන හා තාක්ෂණ කමිටු සඳහා ගෙවීම.	2021.09.28
		14	ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ගෙවීම	2021.10.06
		15	2021 නාගරික සංවර්ධන අධිකාරියේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව	2021.10.22
		16	කොළඹ කොටුව වාර්මර්ස් රථගාල 2018 වර්ෂයේ දී world capital pvt ltd ආයතනයට ලබා දීම තුළ සිදු වූ වංචාව නම් වූ පෙත්සම	2021.11.03
		17	පුත්තලම් දිස්ත්‍රික්කයේ කාර්යාලයේ සිදුවන මූල්‍ය වංචා පිළිබඳ විගණනය	2021.11.23
		18	සභාධිපත්‍යය කළමනාකරණ අධිකාරියේ වාහන සංචිතය සම්බන්ධ විගණනය	2021.12.01
04.	2017.06.26 දිනැති අංක 1/2017 දරන චෙක්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද චෙක්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	එවකට මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MMWD/F/චෙක්කම් හා පිරිවැය කළමනාකරණය හා 2019.10.12 දිනැති ලිපියෙන් 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද චෙක්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යවා ඇත.		
05.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව අදාල කටයුතු සිදුකර අවසන් කර ඇත.		
06.	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	2021 වර්ෂයට අදාල කාල පරිච්ඡේදය තුල පැවති ඉන්ධන සීමාවන් මත සංචිත වාහන වල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂා කිරීම සිදුවී නොතිබුනත්, මේ වන විට අමාත්‍යාංශයේ සියලුම සංචිත වාහන වල ඉන්ධන දහන කටයුතු පරීක්ෂා කිරීම සඳහා සැලසුම් සකස් කර වාර්ෂිකව එම කාර්යය නිසිපරිදි සිදුකරනු ලබයි.		

දෙවැනි කොටස

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	නිවැරදි කරගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර හා වර්ථමාන තත්ත්වය
01.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2021 වර්ෂයේ කාර්ය සාධන ගිවිසුම් සකස් කර තිබුණි. පැවති කොවිඩ් තත්ත්වය හා 2022 වසරේ අමාත්‍යාංශ ප්‍රතිව්‍යුහගත කිරීම හේතුකොට ගෙන කාර්ය සාධන ගිවිසුම් සකස් කර නිසිපරිදි සම්පූර්ණ කිරීමට නොහැකි විය. 2023.11.30 දිනැති අංක 02/2018(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම මේ වන විට අවශ්‍ය නොවන බව දැනම් දී ඇත.
02.	සැලසුම්ගත පුහුණු අවස්ථාවන් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කොවිඩ් අවදානම තදින්ම පැවති වකවානුව වන 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නිලධාරීන් කාර්යාල පරිශ්‍ර තුලට නොකැඳවා නිවසේ සිට රාජකාරී ඉටු කිරීමට විධිවිධාන සලසා තිබූ බැවින් එම කාල සීමාවේදී නිලධාරීන් හට පුහුණු අවස්ථා සලසා දීම අවම මට්ටමකින් සිදුකර ඇත.
03.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කල විගණන වාර්තාවේ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ එකක් නොවිය. 2021 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවට අනුව යටත්ව මතයක් ඉදිරිපත් කර ඇත.
04.	නිලධාරීන්ගෙන් රජයට සිදුවූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	2021 වර්ෂය වන විට නිලධාරීන්ගෙන් රජයට සිදුවූ පාඩු ලෙස හඳුනාගැනීමක් සිදු වී නිබී නැත. ඒ අනුව පාඩු වෙනුවෙන් අයකරගැනිමට අවශ්‍යතාවයක් පැනනැගී නැත.

ප්‍රසන්න රණතුංග (පා.ම.)
ගරු අමාත්‍ය,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

ප්‍රසන්න රණතුංග (පා.ම)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල